**තිහගොඩ ප්‍රාදේශීය සභාව**

**මාතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය පකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 19 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 15 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 31 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට සඳහා වූ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ස්ථාවර වත්කම් ලේඛණය අනුව අක්කර 01 රූඩ් 2 පර්චස් 25 ක් විශාල වූ ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම ගණනය කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් බිල්පතට අනුව ගෙවිය යුතු රු.1,460,860 ක විශ්‍රාම වැටුප් දායක මුදල් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ පත්‍රය අනුව රු.76,879,754 ක් වූ විවිධ ණයගැති වටිනාකමින් මුද්දර ගාස්තු, උසාවි දඩ, වීරි පහන් නඩත්තු, කර්මාන්ත ආධාර යනාදියේ වටිනාකම වූ රු.61,466,558 ක මුදල අඩුකල පසු වටිනාකම රු.15,413,196 ක් විය යුතු වුවද, ණයගැති උපලේඛණයෙහි වටිනාකම රු.3,151,131 ක් වූයෙන් වෙනස රු.12,262,065 ක් විය.

(ඈ) විවිධ ණය හිමියෝ (කර්මාන්ත) 2012 ජනවාරි 01 දිනට ණයහිමි ලේඛණය අනුව වටිනාකම රු.21,418,647 ක් වුවද ප්‍රධාන ලෙජරය අනුව වටිනාකම රු.9,903,188 ක් වූයෙන් වෙනස රු.11,515,459 ක් විය.

1.3.2 අවිනිශ්චිත ගිණුම

ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබූ රු.2,382,841 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය 2012 දෙසැම්බර් 31 දිනටද නිරවුල් නොකර ඉදිරියට ගෙනවිත් තිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 11 කට අදාල පාලන ගිණුම් ශේෂයන්ගේ වටිනාකම රු.132,110,704 ක් වු අතර, උපයෝගී ලේඛණ/උපලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු.137,679,412 ක් වූයෙන් වෙනස රු.5,568,708 ක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.15,366,938 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,233,811 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල ඇතුළත් රු.148,235,973 ක් වටිනා ගිණුම් විෂයයන් දහයක් සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.6,346,938 ක් වු අතර, එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,183,867 ක් විය.

2.2 ආදායම් පර්පාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | අක්කර බදු/කසල බදු | 2 | 305 | 148 |
| (ii) | බදු කුලී | - | 1,214 | 399 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 56 | 266 | 83 |
| (iv) | වෙනත් ආදායම් | 92,445 | 9,245 | 6,969 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 717,179 |
| (ii) | මුද්දර ගාස්තු | 5,700,000 |

2.2.3 හිඟ බදු හා බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාලව ලැබිය යුතුව තිබූ රු.1,031,843 ක වූ බදු මුදල් හා බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන පාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 කඩ කාමර කුලී

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් කඩකාමර වලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.333,313 ක බදු මුදලක්ද සෞඛ්‍ය සේවා කාර්යාලයෙන් රු.66,000 ක කුලී මුදලක්ද හිඟව තිබුණි.

(ආ) තිහගොඩ කඩ කාමර 16 ක් වෙනුවෙන් 2012 වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර කඩ කාමර 05 කින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.129,021 ක කුලී හිඟහිට තිබුණි.

(ඇ) යටියන නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර වෙනුවෙන් 2012 වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර අංක 09 කඩ කාමරයෙන් රු.124,150 ක එක්වන් මුදලද අංක 13,14,15 කඩ කාමරවලින් රු.10,750 ක බදු මුදලක්ද සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිට තිබුණි.

(ඈ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ජනවාරි 01 දිනැති අංක දපපා/පපාකො/2010/01 චක්‍රලේඛය අනුව සෑම ගිවිසුමක්ම වසර 3 කට වරක් යාවත්කාලීන කල යුතුව තිබුණද තිහගොඩ කඩ කාමර සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

2.2.5 ජල ගාස්තු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් ජලය සපයනු ලබන ජල පාරිභෝගික සංඛ්‍යාව 202 දෙදෙනෙක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.401,800 ක ජල ගාස්තු හිඟහිට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ජල සම්පාදන ව්‍යාපෘතියට සභා අරමුදලින් රු.534,517 ක් වැයකර තිබුණ අතර ජල ගාස්තු ලෙස ලැබී තිබුනේ රු.289,438 ක මුදලක් පමණි. මේ අනුව සභාවට රු.245,079 ක අතිරේක වැය බරක් දැරීමට සිදුව තිබුණි.

2.2.6 බලපත්‍ර ගාස්තු

**(අ)** 2012 දෙසැම්බර් 31 දිනට රු.83,178 ක හිඟහිටි ශේෂයක් විය.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 213 වගන්තිය ප්‍රකාරව වෙළඳ බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර

ස්ථාන සඳහා එම වසරේ මාස 06 ක් ඉක්මයාමට ප්‍රථම නඩු පැවරීමට කටයුතු කළයුතු වුවද 2012 වර්ෂයට බලපත්‍ර ගාස්තු ලබා නොගත් ව්‍යාපාර ස්ථාන සඳහා නඩු පැවරීමක් කර නොතිබුණි.

(ඇ) තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ලේඛණයට අනුව සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතික ලබාගත් නව ව්‍යාපාරික ස්ථාන 48 ක්, වර්ෂයේ බලපත්‍ර ගාස්තු ලේඛණයේ සටහන් කර නොතිබූ අතර එකී ව්‍යාපාර ස්ථාන වලින් අයවිය යුතු බලපත්‍ර ගාස්තු අත්හැර තිබුණි.

## 2.3 කොන්ත්‍රාත් පරිපාලනය

සභාවට 2012 වර්ෂය සඳහා ප්‍රාග්ධන ආධාර වශයෙන් රු.80,255,518 ක මුදලක් ලැබී තිබුණ අතර, එකී මුදලින් පලාත් නිශ්චිත, මග නැගුම, ගම නැගුම විමධ්‍යගත අරමුදල් හා සභා අරමුදල් යටතේ රු.85,564,516 ක මුදලක් වැයකර තිබුණි.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මාර්ගවල කොන්ක්‍රීට් කුට්ටිගල් ඇල්ලීමේ කර්මාන්ත සම්බන්ධයෙන් ඇස්තමේන්තු වල අදාල මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භක ස්ථානය හා අවසන් වන ස්ථානය දක්වා නොතිබුණි.

(ආ) සමෘද්ධි සමිති සඳහා ඉදිකිරීම් කර්මාන්ත සෘජුවම ලබාදී තිබුණද එකී සමිතිවලට අදාල කර්මාන්තය ඉටුකළ හැකි බවට විධිමත් සහතිකයක් ලබාගෙන නොතිබුණි.

(ඇ) ගම නැගුම හා මගනැගුම අරමුදල් ප්‍රභවයන් මගින් කරන ලද මාර්ග ඉදිකිරීම් සම්බන්ධයෙන් අදාල ග්‍රාම නිලධාරි වාර්තා ලබාගෙන නොතිබුණි.

(ඈ) ඉදිකිරීම් කර්මාන්තවලට අදාල ගිවිසුම් සභාවේ ලේකම් විසින් අත්සන් කර නොතිබුණ අතරසභාපතිවරයා පමණක් අත්සන් කර තිබුණි. තවද කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) විථිපහන් ක්‍රියාකරු ඉදිරිපත් කරන ලද වාර්තාවල විදුලි පහන් සවිකිරීම් හා අළුත්වැඩියා කිරීම් නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි සටහන් තබා නොතිබීම නිසා නිකුත් කරන ලද පහන් 757 ක් සවිකර තිබුණු බවට තහවුරු කරගත නොහැකි විය.

**(ආ)** 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණ සේවක ණය සහ අත්තිකාරම් ශේෂවල එකතුව රු.990,751 ක් වූ අතර එකී ශේෂය තුළ ස්ථාන මාරු වී ගිය නිලධාරීන් හා සේවකයන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු රු.42,270 ක් ඇතුළත් වී තිබුණි.

2.5 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 පරිදි සේවයෙහි අවශ්‍යතාවයන් මත ඇති වැදගත් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද එවැනි අනුමැතියක් ලබා නොගෙන බඳවාගෙන තිබූ සේවකයින් තිදෙනෙකු සඳහා වැටුප් ලෙස සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.333,492 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) 1990 අංක 28 දරන පළාත් සභා සංශෝධන පනතේ විධිවිධාන ප්‍රකාර බලතල පැවරීම යටතේ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කර තිබූ 1997 පෙබරවාරි 01 හා 2002 මාර්තු 14 දිනැති ලිපි වල උපදෙස් ප්‍රකාරව පළාත් පාලන ආයතනවලට ආයතනමය සේවකයින් පත් කිරීම සඳහා බලතල පළාත් පාලන කොමසාරිස්ගේ ආවරණ අනුමැතියට යටත්ව එකී සභාවේ ලේකම්වරයා සතු වුවද, ඉහත ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද සේවකයින් සභාපතිවරයා විසින් පත්කර තිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබූ අතර සමාලොචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය